“ඔබට වඩා පහළ තත්ත්වයේ පසු වන ජනතාව දෙස ඔබේ අවධානය යොමු කරන්න. ඔබට වඩා ඉහළ තත්ත්වයේ සිටින ජනතාව වෙත අවධානය යොමු නොකරන්න. අල්ලාහ්ගෙන් ඔබට දෙන ලද ආශීර්වාද පිළිබඳ ව ඒවා අල්ප ලෙස ඔබ නොසැලකීමට මෙය කදිම ක්රමය වේ.”

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්රකාශ කළ බව අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: “ඔබට වඩා පහළ තත්ත්වයේ පසු වන ජනතාව දෙස ඔබේ අවධානය යොමු කරන්න. ඔබට වඩා ඉහළ තත්ත්වයේ සිටින ජනතාව වෙත අවධානය යොමු නොකරන්න. අල්ලාහ්ගෙන් ඔබට දෙන ලද ආශීර්වාද පිළිබඳ ව ඒවා අල්ප ලෙස ඔබ
නොසැලකීමට මෙය කදිම ක්රමය වේ.” [صحيح] [متفق عليه]

මෙලොව කටයුතුවල දී නිලය, ධනය, වස්තුව හා වෙනත් දෑහි තමන්ට වඩා පහළ තත්ත්වයේ පසුවන ජනතාව දෙස අවධානය යොමු කරන මෙන් ද මෙලොව ඇති කටයුතුවලදී ඔහුට වඩා ඉහළ තත්ත්වයේ සිටින, ඔහුට වඩා උසස් ජනතාව වෙත අවධානය යොමු නො කරන මෙන් ද නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ නියෝග කළහ. සැබැවින්ම ඔබට වඩාත් පහළ, වඩාත් උරුමය ඇති, වඩාත් උචිත අය දෙස බැලීම අල්ලාහ්ගේ ආශීර්වාද පිළිබඳ ව අවතක්සේරු නොකිරීමට හා ඒවා අල්ප බව නොසැලකීමට කදිම ක්රමය වේ.

http://www.sunnah.global/hadeeth/si/show/5341